# ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
# නිවාස සහ පොදු පහසුකම් අමාත්‍යාංශය

## ලෝක ජනාවාස දිනය - 2008
## සහජීවන නගර"

සහජීවන නගර
ලෝක ජනාවාස දිනය
2008 ඔක්තෝබර් 6

## සහජීවනය අර්ථවත් කළ
## 2008 ලෝක ජනාවාස දිනය

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පුරෝගාමීත්වයෙන් සෑම වර්ෂයකම ඔක්තෝබර් මස ප්‍රථම සඳු දින ලෝක ජනාවාස දිනය සැමරීම සිදුකෙරේ . 1984 වසරේ ජැමෙයිකානු රාජ්‍යයේ කිංස්ටන් නුවරට රැස්වූ එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස කොමිසමේ දි ඉදිරිපත්වූ යෝජනාවක් ක්‍රියාත්මකවීමේ ප්‍රතිඵලයක් ලෙස 1986 වසරේ සිට ජගත් ජනාවාස දිනය සැමරීම ලොව පුරා විහිදී ඇති සියළු රටවල් විසින් සිදුකරනු ලබයි . මේ අනුව ගතවූ වසර 22 ක කාලපරිච්ඡේදය තුළදී ජනාවාස ප්‍රශ්නය වඩාත් දැඩි ලෙසින් පවත්නා නගරය මුල්කොටගත් විවිධවූ තේමාවන් යටතේ ජනාවාස දිනය වාර්ෂිකව සමරනු ලැබිය .

ගතවූ දශක දෙකක කාලය තුළ පහත සඳහන්වූ තේමාවන් යටතේ ලෝක ජනාවාස දිනය සැමරීම වාර්ෂිකව සිදුකොට ඇත .

- 1986 නිවහන මගේ අයිතියයි
- 1987 නිවාස නැත්තවුන් සඳහා නිවහන්
- 1988 නිවහන සහ ප්‍රජාව
- 1989 නිවහන සුවසෙත සහ දරුපවුල
- 1990 නිවහන සහ නාගරීකරණය
- 1991 නිවහන සහ ජීවත්වන පරිසරය
- 1992 නිවහන සහ තිරසාර සංවර්ධනය
- 1993 කාන්තාව සහ නිවාස සංවර්ධනය
- 1994 නිවහන සහ දරුපවුල
- 1995 අපගේ අසල්වැසියෝ
- 1996 නාගරීකරණය,පුරවැසියා සහ මානව විශ්වාසනීයත්වය
- 1997 අනාගත නගර
- 1998 ආරක්ෂිත නගර
- 1999 සැමට නගර
- 2000 කාන්තාව සහ නාගරික පාලනය
- 2001 පැල්පතින් තොර නගර
- 2002 නගරය සහ නාගරික සහයෝගිතාව
- 2003 නගරය සඳහා ජල හා සනීපාරක්ෂක පහසුකම්
- 2004 ග්‍රාමීය සංවර්ධනයේ ජවය නගරයයි
- 2005 සහශ්‍ර සංවර්ධනයේ ඉලක්කය සහ නගර
- 2006 නගරය අපේක්ෂාවන්හි ආකර්ශණීය කේන්ද්‍රයයි
- 2007 සුරක්ෂිත පුරවරය

**සහජීවන නගරය** .

2008 වසරේ ලෝක ජනාවාස දිනය ඔක්තෝබර් මස 06 වන සඳු දින සමරනු ලබයි . මෙවර ලෝක ජනාවාස දින තේමාව වනුයේ ''***සහජීවන නගර***" යන්නයි . ජනාවාස කරනය සහ නාගරීකරණය යන විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ සාකච්ඡා කිරීමේදී කවරවූ පාර්ශවයක් තුළින් වුවද " **සහජීවනය** " යන්න අත්‍යාවශ්‍ය වූ කාර්යය භාරයකි . ලෝක ජනාවාස දින විෂය පථයට අනුකූලව එහි සියළු ක්‍රියාකාරකම් සිදුකරන එක්සත් ජාතීන්ගේ හැබිටාට් සංවිධානය 2008 වසරේ ලෝක ජනාවාස දිනය පිළිබඳ ඇති වැදගත්කම සිය නිල ප්‍රකාශණ තුළින් ඉදිරිපත් කිරීමේදී 2008 වසරේ ලෝක ජනාවාස දිනය සඳහා සහජීවන නගර යන තේමාව නම් කිරීමට හේතූන් ඉතා මනාව පෙන්නුම්කර තිබේ .

කවර හෝ රටක බහුතර ජනකොටස වඩාත් හොඳ දිවිපෙවෙතක් ගතකිරීමේ අරමුණින් එයට අවශ්‍ය යටිතල පහසුකම් පවත්නා නගරයට සංක්‍රමණයවීම නොවැළැක්විය හැකි සාධකයකි . ඒ හේතුවෙන් නගරය තුළ වඩ වඩාත් ආර්ථික හා සමාජීය ගැටළු වර්ධනයවේ. සිමිත භූමි ප්‍රමාණයක් තුළ අසීමිත ජනකොටසගේ සංක්‍රමණයත් සමගින් ඇතිවන සමාජ ප්‍රශ්ණ වඩාත් සංකීර්ණවේ . එකී ප්‍රශ්න සඳහා විසඳුම් සෙවීමේදී අදාළ ප්‍රශ්ණ සඳහා මුහුණ දෙන ජනකණ්ඩායම් හා එයට විසඳුම් සොයන රාජ්‍ය නිලධාරින් මෙන්ම වෙනත් ආයතනික පද්ධතින් අතර සහජීවනයක් ඇතිකරලීම අවශ්‍යයෙන්ම සිදුවිය යුතුවේ .

## ගම සහ නගරයේ සහජීවනය .

මෙම සහජීවන ක්‍රියාදාමය ක්‍රියාවට නැංවීමෙන් මුලික වශයෙන් සිදුවියයුත්තේ නාගරික සංක්‍රමණය හැකිතාක්දුරට වළක්වාලීම බව ජාත්‍යන්තර ජනාවාස විශේෂඥයින්ගේ අදහසයි .ඒ අනුව නගරය ආකර්ශණය කරන පහසුකම් හැකිපමණින් නගරයෙන් බැහැර ප්‍රාදේශිකය තුළ වර්ධනය කිරිම තුළින් නගරයට සංක්‍රමණය වන ජනතාව ගම සහ ප්‍රාදේශිකයේ රඳවා ගැනිමේ හැකියාව ලැබේ. මේ සඳහා ලොව බොහෝ රටවල් විවධවු වැඩපිලිවෙල දියත්කොට ඇති අතර, ශ්‍රි ලංකාවේ ක්‍රියාත්මක වන නිවාස හා ජනාවාස සංවර්ධන වැඩසටහන එයින් වඩාත් කැපීපෙනේ .

**“මහින්ද චින්තන”** ක්‍රියාදාමයට අනුකූලව ක්‍රියාවට නැංවෙන “ජනසෙවන ජාතික නිවාස ප්‍රතිපත්තිය” මත වඩාත් සංකිර්ණ ජනාවාස ගැටළු පවත්නා නගරයේ නිවාස හා ජනාවාස ගැටළුවට විසදුම් සෙවිමට සමගාමිව රටෙ බහුතර ජනකොටසක් පාරම්පරිකව ජිවත්වන ග්‍රාමිය ප්‍රදේශයන්හි යටිතල පහසුකම් වර්ධනයකොට ගම සංවර්ධිත ජනාවාසයන් බවට පත්කරලීමට රජය ප්‍රමුඛත්වයක් ලබාදී ඇත . මෙයට අමතරව ගම ආශ්‍රිතවම වැව්ලිකරයේ සාම්ප්‍රදායිකව බිහිවු වතු ජනාවාස මුලික පහසුකම්වලින් සමන්විත වතු නිවාස ව්‍යාපෘතින් ලෙසින් වර්ධනයකරලීම තුළින් වතුකරයේ වැඩකරන ජනතාවටද වඩාත් හොඳ නිවාස පහසුකම් ලබාදීමට උත්සාහයක් ගෙන තිබේ . මෙම ක්‍රියාදාමය දෙස ආපසු හැරි බැලිමේදි ගම නගරය සහ වතුකරය ආශ්‍රිතව සහජීවනයක් ගොඩනැගිම ශ්‍රි ලංකාවේ වත්මන් නිවාස හා ජනාවාස වැපිලිවෙලේ මුලික කාර්යය භාරයක් වන අතර, එනයින් බලන කළ ජනාවාසකරණයේ සහජීවනය, ශ්‍රි ලංකාව තුළ වර්තමානයේදි වඩාත් අර්ථවත් හා ඵලදායි අයුරින් ක්‍රියාවට නැංවෙන බව පෙනියයි .

## ජාතින් අතර සහජීවනය .

සහජීවන විෂය තුළින් වර්තමාන ජනාවසකරණයේ අභියෝග රැසක් ජයගැනීමට සිදුවි තිබේ. විශේෂයෙන් නාගරික ජනාවාස විවිධවු ජනකණ්ඩායම් නියෝජනය කරන මිශ්‍ර සංස්කෘතියකට හිමිකම් කියන ප්‍රදේශයකි . අවිදිමත් හෝ විදිමත් අයුරින් පරම්පාර ගණනාවක් මෙම නාගරික වැසියන් අතර සහජීවනය ගොඩනැගි තිබේ .කවර හෝ හේතුවක් තුළින් එයට සුළු වශයෙන් හෝ හානියක් සිදුවු විට එය ජාතික ව්‍යසනයක් දක්වා වර්ධනයවි තිබේ . ශ්‍රි ලංකාවේ මෙන්ම ලොව බොහෝ රටවල් මේ අත්දැකිම් සතුවේ.

කොළඹ නගරය වැනි ප්‍රධාන නගර රැසක් තුළ විවිධ ජනකණ්ඩායම් සිය ජාති ආගම් හා සංස්කෘතික අනන්‍යතාවයන් රැකගනිමින් මනා සහජීවනයකින් ජිවත්ව ඇති අතර විවිධ අවස්ථාවන්හීදි එයට හානි සිදුවුව ද එය නැවත නිවැරදි කර ගැනීම ඔවුන් විසින්ම සිදුකරගනිමින් නැවත නැවත තම ජනාවාසය තුළ සහජීවනයකින් ජිවත්විම ඔවුන් විසින් සිදුකොට තිබේ . අද මෙම සහජීවන ක්‍රමවේදය නගරයෙන් ගමටත් , ගමෙන් වතුකරයටත් ව්‍යාප්ත වෙමින් පවත්නා අතර, එය වඩාත් ඵලදායි අයුරින් ක්‍රියාත්මක කිරිමට මෙවර ලෝක ජනාවාස දිනය දායකකරගත හැකිවේ .

## විපත් අවමකළ සහජීවන දායකත්වය .

මෙවර ජනාවාස දින තේමාව යටතේ ඉහතින් සඳහන්කොට ඇති සමාජ සහජීවනය මානව සහජීවනය මෙන්ම ස්වභාවික හා භෞතික සහජීවනය කෙරෙහිද විශේෂිත අවධානයක් යොමුකළ යුතුබව එක්සත් ජාතින්ගේ හැබිටාට් සංවිධානය පෙන්නුම් කරයි . මෑත වසර කිහිපය තුළදී ලොව මුහුන පෑ විශාලතම ආපදාවන් සිදුවුයේ ස්වභාවික හා මිනිසා විසින් නිර්මිත විපත් තුළිනි . විශේෂයෙන් ශ්‍රි ලංකාව වැනි රටවල් පසුගිය කාලපරිච්ඡේදය තුළ මුහුණ දුන් සුනාමි හා කඳුනායයැම් වැනි විපත් නාගරික ප්‍රදේශ

මෙන්ම රටේ සෙසු ප්‍රදේශ දැඩි පාරිසරික ගැටළුවකට මෙන්ම ජනසමාජයේ විපත්තිදායක තත්ත්වය වර්ධනය විමටද හේතුවී ඇත . මෙයට අමතරව මිනිසා විසින්ම නිර්මිත විපත් ඔවුන්ගේම ජනජීවිතයට දැඩි බලපෑමක් සිදුකොට තිබේ . සීඝ්‍ර සංවර්ධනයේ ප්‍රතිඵලයක් ලෙසින් ඇතිවූ වාණිජ ප්‍රවාහය ස්වභාව ධර්මයාගේ විවිධ නිර්නායක වෙනස් කරමින් මිනිසා විසින් සිදුකළ දැ දෛනික දිවිපෙවෙතට භාරකළ ආකාරය සංවර්ධිත හා සංවර්ධනය වු රටවල අත්දුටු සත්‍යයක් බවට පත්ව තිබේ . එමෙන්ම ලොව බොහෝ රටවල් අද මුහුණපා සිටින ත්‍රස්තවාදි හා යුධමය ගැටුම් මිනිසා විසින් නිර්මාණයකරන ලද ගැටළුන්වේ . මේවා මිනිසා විසින්ම මිනිස් සමාජයේ අයහපත වෙනුවෙන් නිර්මාණය කරගත් කාර්යයන් විසින් හඳුන්වාදිය හැකිවේ. මෙම තත්ත්වයන් හැකිතාක්දුරට අවමකොට සමාජයේ සහසබඳතාවයන් ගොඩනැගිම වෙනුවෙන් ප්‍රායෝගික වැඩපිලිවෙල කෙරෙහි අවධානය යොමුකිරිම මෙවර ලෝක ජනාවාස දිනයේ මුලික අරමුණකි .

මෙවන්වු විපත් අවම කරගැනීම සඳහා එකී ක්‍රියාකාරකම් සිදුකරන කණ්ඩායම් මෙන්ම එහි ප්‍රතිපල ලබන පිරිස් අතර සහජීවනයක් ගොඩනැගිම මෙවර ජනාවාස දිනයේ තේමාවේ එක් විශේෂ අවශ්‍යතාවයකි .

මේ සියළු ක්‍රියාකාරකම් කෙරෙහි විශේෂ අවධානයක් යොමුකරමින් 2008 ලෝක ජනාවාස දිනය සහජීවන නගර තේමාකොට ලොව විවිධ රටවල ක්‍රියාත්මකවේ . එය වඩාත් ඵලදායි අයුරින් ක්‍රියාවට නැංවීම ගතවු වසර 22 ක කාලපරිච්ඡේදය තුළ ලෝක ජනාවාස දිනය උත්කර්ශවත් අයුරින් සැමරු ශ්‍රී ලංකාවේද මුලික බලාපොරොත්තුවයි .

## ආයතනික සහජීවනය .

ඒ අනුව 2008 වසරේ ලෝක ජනාවාස දිනය කොළඹට සමිප නගරයක් වු මොරටුව නගරය මුල්කොට දිප ව්‍යාප්තව සැමරීමට රජය විසින් තිරණය කරනු ලැබිය .නිවාස හා ජනාවාස විෂය පථය හා සම්බන්ධ ප්‍රධානතම අමාත්‍යාංශ දෙකක් වු නිවාස හා පොදුපහසුකම් අමාත්‍යාංශය හා නාගරික සංවර්ධන හා පුජාභූමි සවර්ධන අමාත්‍යාංශය වාර්ෂිකව මෙම ජනාවාස දින සැමරුම සිදුකරන අතර බොහෝ අවස්ථාවන්හිදි මෙකි අමාත්‍යාංශයන් වෙන් වෙන්ව සිය ආයතන දායකකර ගනිමින් ජනාවාස දින වැඩසටහන් ක්‍රියාත්මක කිරිම ගතවු වර්ෂයන්හි අත්දැකීම විය .

මෙම තත්ත්වය වෙනස් කරලමින් ප්‍රථම වතාවට නාගරික සංවර්ධන හා පුජාභූමි සංවර්ධන අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමන් හා නිවාස හා පොදුපහසුකම් අමාත්‍ය ගරු ෆේරියල් අෂ්රොෆ් මැතිණියගේ පුරෝගාමිත්වයෙන් මෙම අමාත්‍යාංශ ද්විත්වය සිය අමාත්‍යාංශ ආයතනය හා වෙනත් රාජ්‍ය ආයතන සහ සංවිධාන දායක කරගනිමින් ක්‍රියාවට නැංවු අතර, ඒ තුළින්ම ආයතනික සහජීවනයක් ගොඩනැගි ඇති බව මනාව පෙන්නුම්කර තිබේ .

## මොරටුව මුල්කොට ජනාවාස දින සැමරුම් .

ලෝක ජනාවාස දින මෙවර සැමරිමේ ශ්‍රී ලාංකිය කේන්ද්‍රිය ස්ථානය වනුයේ මොරටුව නගරයයි . පාරම්පරික කර්මාන්ත පුවරයක්වු මොරටුව පුරවරය වත්මන් සමාජ රටාව තුළ නව තාක්ෂණයට හිමිකම් කියන විවිධ කේන්ද්‍රිය මධ්‍යස්ථාන රැසකට හිමිකම් කියන නගරයකි .එමෙන්ම ශ්‍රී ලාංකික ජනසමාජය නියෝජනය කරන සියළු ජනකොටස් සහජීවනයකින් ජිවත්වන්නාවු මොරටුව පුරවරය ආශ්‍රිත කෙටි කාලීන ජනාවාස සංවර්ධන වැඩපිලිවෙලක් දියත් කිරිම මෙවර ජනාවාස දින සංවර්ධන වැඩසටහන තුළින් සිදුකෙරේ . නගරය පිළිසකර කිරිම ජනාවාස සංවර්ධනය නිවාස වැඩිදියුණුව ඇතළු විවිධ ක්‍රියාකාරකම් රැසක් ලෝක ජනාවාස දිනය නිමිතිකොට මොරටුව නගරය හා තදාසන්න ප්‍රදේශයන්හි සිදුකෙකෙර් . මොරටුව පුරපති වරයා ඇතුළු මොරටුව මහනගර සභාව මේ සියළු ක්‍රියාකාරකම් සම්බන්ධිකරණය කරමින් ඵලදායි අයුරින් ක්‍රියාවට නැංවිම මෙම වැඩපිලිවෙලේ ඇති තවත් වැදගත් ලක්ෂණයකි .

පසුගිය වර්ෂවලදි මෙන්ම මෙම වසරේදි ද ශ්‍රී ලංකාවේ ලෝක ජනාවාස දින වැඩපිලිවෙල හුදෙක් නගරයට හෝ ප්‍රදේශයකට සිමාවී ක්‍රියාත්මක නොවේ . සෑම වසරකම ජනාවාස දින සංවර්ධන ක්‍රියාවලිය දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කිරිමට නිවාස හා පොදුපහසුකම් අමාත්‍යාංශයේ මගපෙන්විම යටතේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් කටයුතු යොදා තිබේ . උතුරු නැගෙනහිර ප්‍රදේශ ඇතුළු දිවයිනේ සැම දිස්ත්‍රික්කයකම පසුගිය මාස 06 ක කාලපරිච්ඡේදයක් තුළ ජනාවාස සංවර්ධන ක්‍රියාත්මක කිරිම සිදුවිය .එම වැඩපිලිවෙල යටතේ පවත්නා නිවාස වැඩිදියුණු කිරිම, නව ජනාවාස ව්‍යාපෘතින් ආරම්භ කිරිම , සිදුකරනු ලබයි . මෙයට අමතරව ජනාවාස දිනය තේමාකොටගත් සම්මන්ත්‍ර ණ වැඩමුළු පැවැත්වීම ද මෙහිලා ඇති තවත් එක් විශේෂ කාර්යයභාරයකි .

## ජනාවාස සති වැඩපිළිවෙල .

වෙනත් බොහෝ ජාත්‍යන්තර දින සැමරුම් එක් දිනයකට සීමාවේ. එනමුත් ලෝක ජනාවාස දිනය ආශ්‍රිත ක්‍රියාකාරකම් පසුගිය වසර කිහිපය තුළදී අවම වශයෙන් සතියක කාලපරිච්ඡේදයක් තුළ නොකඩවා ක්‍රියාත්මක විය . ඒ අනුව 2008 වසරේ සැප්තැම්බර් මස 29 දින සිට ඔක්තෝබර් 05 ඉරුදින දක්වා වූ කාලය 2008 ලෝක ජනාවාස දින සතිය ලෙස නම්කොට තිබේ . එම කාලය තුළ දිවයින පුරා ක්‍රියාත්මක කෙරුනු විවිධ ජනාවාස ව්‍යාපෘතීන් එම සංවර්ධනයේ ප්‍රතිලාභ ලැබූ ජනකණ්ඩායම් වෙත පවරාදීම සිදුකරනු ලබයි. ජනාවාස දින සම්මන්ත්‍රණ හා වැඩමුලු සංවිධානයකොට ඇත්තේ ද මෙම කාලපරිච්ඡේදය තුළදීය .

## පාසල් සිසුනට මුල්තැන .

ජනාවාස දින සංවර්ධන ක්‍රියාදාමයේ වැඩි අවධානයක් යොමුකර ඇත්තේ අනාගත සමාජයේ වගකීම භාරගැනීමට සිටින පාසල් දරු දැරියන් කෙරෙහිය. ඒ අනුව සහජීවන නගර තේමාකොට පාසල් දරු දැරියන්ගේ අනාගත වගකීම් ඔවුනට අවබෝධකර දී ඒ සඳහා ක්‍රියාකාරී වැඩසටහන් වෙනුවෙන් ඔවුනගේ දායකකත්වය ලබාගැනීම මෙවර ජනාවාස දිනයේ ඇති එක් විශේෂ ක්‍රියාකාරකමකි .

ජනාවාස දින තේමාව මුල්කොට චිත්‍ර හා රචනා තරග සංවිධානය කිරීම කෙටි නාට්‍ය හා කථික තරඟ පැවැත්වීම මෙහිදී සිදුකෙරේ . වාර්ෂිකව පැවැත්වෙන මෙම වැඩපිළිවෙල සඳහා දීප ව්‍යාප්තව පාසල් සිසුන් දහස් ගණනකගේ සහභාගීත්වය හිමිවන අතර, ඔවුන් ඉදිරිපත් කරන නිර්මාණ තුළින් ජනාවාස දිනයේ තේමාවෙහි ඇති වැදගත්කම වඩාත් අර්ථවත්කොට තිබේ .

## ජනාවාස දින ජාතික සමුළුව .

2008 ලෝක ජනාවාස දිනය නිමිත්තෙන් ක්‍රියාවට නැංවූ විවිධ වැඩසටහන්හි සමාප්තිය සනිටුහන් කරමින් පැවැත්වෙන ජනාවාස දින ජාතික සමුළුව ඔක්තෝබර් 06 දින මොරටුව සර්වෝදය විශ්ව සමාධි ශාලාවේදී පැවැත්වේ . මෙහිදී මෙම වසරේ ජනාවාස දිනය නිමිතිකොට මොරටුව නගරය හා දිවයින පුරා ක්‍රියාත්මක කෙරුනු විවිධවූ වැඩසටහන් සමාලෝචනයට ලක්කිරීමත් ජනාවාස සංවර්ධන උදෙසා ඉදිරියේදී ක්‍රියාවට නැංවියයුතු වැඩසටහන් හඳුනාගැනීමත් සිදුකෙරේ. එමෙන්ම ජනාවාස දින වැඩසටහනේ වඩාත් ක්‍රියාකාරී වැඩසටහන් රැසකට දායකවූ පාසල් සිසුන් ඇතුළු අනෙකුත් දායක කණ්ඩායම් අගය කිරීම සිදුකෙරෙනු ඇත .

**ලක්විජය සාගර පලන්සූරිය**

ලෝක ජනාවාස දිනය
2008 ඔක්තෝබර් 6